# රෝහණ රාජ්‍යයේ ඓතිහාසික ලෙන් පරිශ්‍රයන්හි අප්‍රකට සිතුවම් පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

(කරඹගල හා මදුනාගල පුරාණ විහාරස්ථාන ඇසුරින්)

ඩබ්.එම්. චතුරි පූර්ණිමා, ඩී.එස්. රණසිංහ

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

cathu933@gmail.com

ප්‍රමුඛ පදඃසිතුවම්, ගල්ලෙන්,වර්ණ, බෝධිසත්ව රූප

## හැඳින්වීම

ශ්‍රී ලාංකීය සංස්කෘතිය පෝෂණය කිරීමෙහිලා සිතුවම් කලාව සුවිශේෂී දායකත්වයක් සපයන්නට වූ අතර සිත්තරුවන් විවිධ තේමා හා වාස්තු විෂයන් යටතේ බෞද්ධ වෙහෙර විහාරස්ථානයන් හි සිතුවම් සිත්තමට නගා ඇත. ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම වර්තමානය දක්වාම ඇරඹී සිතුවම් කලාව මහින්දාගමනයත් සමඟ අනුරාධපුර,පොළොන්නරු යුගවල දී සංස්කෘතික ප්‍රබෝධයක් ඇති විය.මුල් කාලීනව වර්ධනය වන ලෙන් විහාර සම්ප්‍රදායේ මෙන්ම පසුකාලීනව වර්ධනය වන වෙනත් විහාරාරාම සම්ප්‍රදායන් හි ප්‍රධාන අංග ලක්ෂණයන් බවට සිතුවම් පත්වන අතර එමෙන්ම ලෙන් විහාර සම්ප්‍රදාය තුළ රුහුණේ පිහිටි කරඹගල හා මදුනාගල යන විහාරස්ථානවලින් ලැබී ඇති සිතුවම් සාධක ප්‍රමාණයක් ඒවායේ ඓතිහාසික අනන්‍යතාවය තහවුරු කොට දක්වයි.පෞරාණික විහාරස්ථානයන් වශයෙන් ඓතිහාසික වටිනාකම් ආරෝපණය කිරීම උදෙසා දායක වන සිතුවම් පිළිබඳ විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රමුඛ අරමුණයි. කරඹගල හා මදුනාගල ලෙන් පරිශ්‍රයහි අප්‍රකට සිතුවම් හි අතීත හා වර්තමාන තත්ත්වය කෙබඳු ද? යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ ප්‍රධාන ගැටළුව විය.

## ක්‍රමවේදය

රෝහණ රාජ්‍යයේ ඓතිහාසික කරඹගල හා මදුනාගල ලෙන් පරිශ්‍රයන්හි අප්‍රකට සිතුවම් පිළිබඳ අධ්‍යයනයේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය යන ක්‍රමවේදයන් ද්විත්වය භාවිතයෙන් දත්ත ගොනු කරන ලදි. මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන් ගුණාත්මකව දත්ත ඉදිරිපත් කිරීමට සිදු කෙරේ. ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ දෙවිහාරස්ථානයන්හි සිතුවම් නිරීක්ෂණය හා ඡායාරූපකරණය සිදු විය.පුස්තකාල අධ්‍යයනය මඟින්ද තොරතුරු රැස් කරන ලදි. ක්ෂේත්‍ර සමීක්ෂණය යටතේ සම්මුඛ සාකච්ඡා මඟින් එක්රැස් කර ගනු ලබන දත්ත ගැඹුරින් විමසා මෙම දෙවිහාරස්ථානයෙ හි සිතුවම් පිළිබඳ අධ්‍යයනය ලක් කරනු ලැබේ. ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතියික මූලාශ්‍රය තුළින් තොරතුරු රැස් කර ගත් අතර ප්‍රාථමික මූලාශ්‍රය ලෙස මහාවංසය හා ධාතුවංසය පරිශීලනය හා ද්විතියික මූලාශ්‍රය ලෙස කරඩුලෙන හා මදුනාගල ඓතිහාසික විහාරස්ථාන සම්බන්ධයෙන් සිදු කර ඇති පර්යේෂණ ලිය වූ කෘතීන් මෙන්ම පර්යේෂණයට අදාළ කර ගත හැකි ලේඛණ නිරීක්ෂණයට ලක් කෙරේ.මෙම පර්යේෂණයේ පර්යේෂණ ක්ෂේත්‍රය දකුණු පළාතේ සූරියවැව ප්‍රදේශයේ

ඓතිහාසික කරඹගල හා මදුනාගල ලෙන් පරිශ්‍රයන්හි සිතුවම්වලට සිමා කරනු ලැබේ. මෙහිදී කරඹගල හා මදුනාගල යන විහාරස්ථානයන්හි පැරණි හා නූතන සිතුවම් කලාවට පර්යේෂණයේ ක්ෂේත්‍රය සීමා කෙරේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මෙම පර්යේෂණය මඟින් කරඹගල හා මදුනාගල ඓතිහාසික විහාරස්ථානයන් හි සිතුවම් කලාවේ අතීත හා වර්තමාන තත්ත්වය පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ.අතීතයේ පැවතුණා යැයි සඳහන් කළ හැකි පැරණි සිතුවම් කලාවක ශේෂයන් හා මෑත කාලීනව නිර්මාණය කරන ලදැයි සඳහන් කල හැකි සිතුවම් කලාවක සාධක පිළිබඳව අධ්‍යයනය කළ හැකිය. පැරණි සිතුවම් කලාව හානූතන සිතුවම් කලාව යනුවෙන් විකාශනයන් පර්යේෂණයට ලක් කළ හැකිය.

අතීතයේ පැවතුණා යැයි සඳහන් කළ හැකි පැරණි සිතුවම් කලාව පිළිබඳ සාධක බොහෝමයක් කරඹගල විහාරයෙන් සොයා ගත හැකි වේ. වර්තමානය වන විට චිත්ත ගුත්ත ලෙණ නමින් හඳුන්වන ගල්ලෙන් වියනේ හා තවත් ගල්ලෙනක සිතුවම් සාධක දැකිය හැකිය. එම සිතුවම්හි වාස්තු විෂය වී ඇත්තේ බෝසත් රුවක ශීර්ෂයක් හා ඒ වෙත මල් විසිකරන අප්සරාවකගේ රූපයක උඩකොටසක්, විපස්සි, සිඛී, වෙස්සභූ, කකුසඳ, කෝණාගම, කාශ්‍යප, ගෞතම යන බුදුවරුන් ගිහිගෙය නික්මයෑමේ පුවත යනාදි සිත්තම් කර තබේ. චිත්ත ගුත්ත ලෙනේ දක්නට ලැබෙන සිතුවම් කොටස්වල වර්ණ, රේඛා භාවිතය, බදාම යොදා සකසා ගත් පසු තලය ආදි අංග ලක්ෂණ නූතනය වන විටත් දැකගත හැකි අතර සිතුවම් කොටස් හමුවී ඇති අනෙක් ගල්ලෙනේ බදාම යොදා සකසා ගන්නා ලද පසුතලයේ කොටස් පමණක් දක්නට තිබේ. මේ සිතුවම් නිර්මාණය කර ඇති අන්දම පිළිබඳ සඳහන් කිරීමේ දී ගල්ලෙන් තලය යම්තාක් සමතලා කිරිම උදෙසා වැලි මිශ්‍ර බදාම ශේෂයක් යොදාගෙන ඇති බව පැහැදිලි වේ. ප්‍රමාණයන් දළ වශයෙන් වර්ග අඩි 3-3½ තරම් වූ කොටසක පැරණි බදාම තට්ටු විසිරි පැවතීම නිසා ප්‍රමාණයෙන් විශාල සිතුවමක් එහි වූ බව උපකල්පනය කළ හැකිය. වර්ග අඩි ½ ක් තරම් වූ බදාම කොටස් සාධක පැහැදිලි ව විමර්ශනය කිරිමේ දී කහ, රතු, කොල වැනි වර්ණ ඒ සඳහා භාවිත කර ඇති අන්දම හඳුනාගත හැකි වේ. කහ වර්ණය රන්වන් පැහැයට හුරු අයුරින් සිතුවම් හි පසුබිම සඳහා යොදා ගෙන තිබෙන ආකාරත්, රතු වර්ණය එහි රූපවල ශරිරයේ කොටස් රේඛා මඟින් දැක්වීමට යොදා ඇති බවත් එම රූපයේ අත්වල ඇඟිලි කොටස් රතු වර්ණයෙන් නිමවා ඇති අන්දම එයට සාධක පෙන්නුම් කරයි. කරඹගල විහාරස්ථානයෙන් අනාවරණය වී ඇති සිතුවම් සාධක තුළින් අතීතයේ පටන් බෞද්ධ විහාරස්ථාන ආශ්‍රයෙන් ගොඩනැගී වර්ධනය වන සිතුවම් කලාවක් පැවති බවට සාධක සොයාගත හැකි ය.

කරඹගල විහාරස්ථානයේ ඇති පැරණි සිතුවම් සාධක හැරුණු විට නූතන සිතුවම් සාධක කිහිපයක් ද දැකිය හැකිය. මෙම විහාරස්ථානයේ චිත්ත ගුත්ත ලෙණ නමින් හඳුන්වන ලබන පැරණි සිතුවම් වූ ගල්ලෙන්හි බිත්ති මත එම සිතුවම් සාධක නිර්මාණය කර සිමෙන්ති බදාමෙන් ගල්ලෙන් බිත්තිය සකස් කර ගනිමින් ගල්ලෙණෙ හි වම් පසට වන්නට තීරු 8 කින් පමණ සමන්විත කොටසක මෙම සිතුවම් නිර්මාණය කර ඇත. සිතුවමක ප්‍රමාණය දළ වශයෙන් වර්ග අඩි 3½ ක් පමණ වේ. මුල් කාලයේ දක්නට ලැබුණු සිතුවම් කොටස රතු, සුදු, කළු ආදි වර්ණ සාධක භාවිත කරමින් නිර්මාණය කර තිබීම එහි අතීත ස්වරූපය විදහා දක්වයි.

මෙවන් සිතුවම් සාධක ප්‍රමාණයක් චිත්ත ගුත්ත ලෙණ නමින් හඳුන්වන විහාරයේ දක්නට ලැබෙන අතර කරඹගල විහාරයේ සංවර්ධන කටයුතු උදෙසා ඇප කැපවී කටයුතු කල නායක ස්වාමීන් වහන්සේලාගේ සේයාවන් සිතුවමට නගා තිබේ. මේවා නිර්මාණය කිරීමේදී පසුබිම සකස් කරගැනීමේ සිට වර්ණ භාවිත කිරීම ආදි ශිල්ප විධි නූතන සිතුවම් කලාවේ අංග ලක්ෂණයන්ට සමාන වන අයුරින් නිමවා තිබීම පර්යේෂණයට ලක් කළ හැකි ය.

මදුනාගල විහාරස්ථානයේ පැරණි සිතුවම් කලාව පිළිබඳ සාධක වර්තමානයේ අනාවරණය කර ගත හැකි තත්ත්වයක නොමැති බව පර්යේෂණයෙන් තහවුරු වේ. එනම් එසේ තිබුණා යැයි සඳහන් සිතුවම් සම්පූර්ණයෙන්ම විනාශ මුඛයට පත්ව ඇති බැවිනි. නූතන සිතුවම් කලාව පිළිබඳ සාධක ප්‍රමාණයක් මදුනාගල විහාරස්ථානයේ දැකිය හැකිය. මෙම සිතුවම් සාධක මෑත කාලීනව නිර්මාණය කොට ඇති මදුනාගල චෛත්‍ය හා සම්බන්ධ අභ්‍යන්තර ගෘහය තුළ සිතුවම් කර ඇත. බිත්ති කොටස් වලට බෙදා දක්වමින් අටවිසි බුදුන් විවරණ ලැබීමේ සිතුවම් නිර්මාණය කොට තිබේ. එමෙන්ම මදුනාගල විහාරස්ථානයේ උන්නතිය උදෙසා ඇපකැප වී ක්‍රියාකළ වතුරවිල ශ්‍රී ඤාණානන්ද නායක මාහිමියන්ගේ රුව සිතුවමට නගා ඇත.

මෙවන් සිතුවම් සාධක බොහෝමයක් නිර්මාණය කිරීම උදෙසා නූතන සිතුවම් කලාවේ ලක්ෂණ උපයෝගි කරගෙන ඇත. මෙම සිතුවම් සාධක 1990 දශකයේ නිර්මාණය ලක්ෂණ පෙන්නුම් කරයි. පසුබිම සකසා ගැනීම, වර්ණ යෙදීම ආදි සාධක මෙන්ම ඒවා සිතුවමට නැගීම නූතන ලක්ෂණ වූ බව පැහැදිලි වේ. දෙවිහාරස්ථානයන්හි නිරූපිත සිතුවම් කලාව කාල නිර්ණයේදි අනුරාධපුර කාල පරිච්ඡේදයට අයත් විය හැකි බවත් මෙම සිතුවම් ශෛලීය සම්භාව්‍ය සිතුවම් කලාවක ලක්ෂණ ප්‍රකට කරන්නට වූ බව නිගමනය කළ හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


ශ්‍රී සුමංගල මාහිමි,හික්කඩුවේ., දේවරක්ඛිත, බටුවන්තුඩාවේ. (2003)*මහාවංසය.* සංස්. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

විජේසේකර, නන්දදේව. (1964)*පැරණි සිංහල බිතු සිතුවම්.* රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව.

අබේසේකර, ප්‍රසන්න. (සංස්). (1989)*ලංකා බිතු සිතුවම් සටහන්.* ශ්‍රී ලංකා පුරාවිද්‍යා සංගමය.